# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/45 - 2021 දෙසැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

52 වන වගන්තිය යටතේ වූ නියමය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 52 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ විදුලිබල විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ නිර්දේශය මත,

(අ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් වන ද.වෝ. 220/132ක් බලැති වහරු උපපොලක් ඉදි කිරීම සඳහා වහාම අවශ්‍ය වන බව ; සහ

(ආ) එකී විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය මහජන කාර්යයක් වන බැවින් මහජනතාවගේ පොදු සුබසාධනය සහ ප්‍රතිලාභය පිණිස වන බව,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මාගේ මතය වන බැවින්, එකී ඉඩම ඉහත කී කාර්යය සඳහා අවශ්‍ය වන බව නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 35586 — 15 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, උඩුකහ කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (අංක 869) වීරඹුගෙදර ග්‍රාම නිලධාරී වසමේ, නවානෙගෙදර ග්‍රාමයේ පිහිටි පඹේවත්ත නැමති ඉඩමට විදුලිබල මණ්ඩලය විසින් සාදන ලද 2001 ජූලි මස 29 වන දිනැති අංක CEB/PR/PD/PSRSPI/TE/DRG/002 දරන දළ සැලැස්මේ කැබලි අංක A, කැබලි අංක B සහ C වශයෙන් සඳහන් කර ඇති හෙක්ටයාර 13.0134 (අක්කර 32, රූඩ් 0, පර්චස් 25.12)ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

කැබලි අංක : A

*උතුරට* : කුරියාමුල්ල සහ ප්‍රාදේශීය සභා මාර්ගය ;
*නැගෙනහිරට* : ඇළ රක්ෂිතය සහ කන්දෙවත්ත නමැති ඉඩම ;
*දකුණට* : කන්දෙවත්ත නැමති ඉඩම ;
*බස්නාහිරට* : කන්දෙවත්ත නැමති ඉඩම.

*ප්‍රමාණය* : හෙක්ටයාර 12.46487 (අක්කර 30, රූඩ් 03, පර්චස් 8.22)

*හිමිකම් පෑම* : කුරුණෑගල, මීගමුව පාර, අංක 111 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වන සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීවී 105918 දරන එස්. කේ. ඉන්වෙස්මන්ට් සොලුයුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කැබලි අංක : B

*උතුරට* : අංක 957 දරන පිඹුරේ කැබලි අංක 02 ;
*නැගෙනහිරට* : කැබලි අංක C ;
*දකුණට* : අංක 957 දරන පිඹුරේ කැබලි අංක 1D සහ කැබලි අංක 1E ;
*බස්නාහිරට* : ඇළ රක්ෂිතය.

*ප්‍රමාණය* : හෙක්ටයාර 0.28353 (අක්කර 0, රූඩ් 02, පර්චස් 32.10)

*හිමිකම් පෑම* : නොදනී.

කැබලි අංක : C

*උතුරට* : අංක 957 දරන පිඹුරේ කැබලි අංක 3A ;
*නැගෙනහිරට* : මාර්ග සංවර්ධන අධිකාරිය මාර්ගය (කලුගමුව සිට වාරියපොළ දක්වා) ;
*දකුණට* : අංක 957 දරන පිඹුරේ කැබලි අංක 3A ;
බස්නාහිරට : කැබලි අංක B.

*ප්‍රමාණය* : හෙක්ටයාර 0.26507 (අක්කර 0, රූඩ් 02, පර්චස් 24.80)

*හිමිකම් පෑම* : කුරුණෑගල, මීගමුව පාර, අංක 111 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වන සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීවී 105918 දරන එස්. කේ. ඉන්වෙස්මන්ට් සොලුයුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

EOG 12 - 0168

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.